# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2025

**10 ශ්‍රේණිය**

**කෘෂි හා ආහාර තාක්ෂණය - I**

නම/ විභාග අංකයඃ ........................................ කාලය පැය 1 යි

- **නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01) ධාතුසේන රජතුමා විසින් නිර්මාණය කරන ලද අඩි 40 ක් පළල සැතපුම් 54 ක් දිග යෝධ ඇළ මගින් ජලය ගෙන යනු ලබන්නේ
1) තිසා වැවේ සිට කලා වැවටයි
2) කලා වැවේ සිට තිසා වැවටයි
3) තිසා වැවේ සිට නුවර වැවටයි
4) තිසා වැවේ සිට මින්නේරිය වැවටයි

02) ශ්‍රී ලංකාවේ විශාලතම බහුකාර්ය සංවර්ධන යෝජනා ක්‍රමය වන්නේ
1) ගල් ඔය යෝජනා ක්‍රමයයි
2) මහවැලි යෝජනා ක්‍රමයයි
3) උඩවලව යෝජනා ක්‍රමයයි
4) මුතුකණ්ඩිය යෝජනා ක්‍රමයයි

03) එක් වැවකින් පෝෂණය වන ප්‍රදේශය ඊළඟ වැවේ ජල පෝෂක ප්‍රදේශය ලෙස සකස් කළ වැව් පද්ධතිය හඳුන්වන්නේ
1) එල්ලංගා පද්ධතිය ලෙසය
2) වැව් බැඳි රාජ්‍යය ලෙසය
3) වැව් ඉස්මත්ත ලෙසය
4) වැව් තාවුල්ල ලෙසය

04) රටක ආහාර සුරක්ෂිතතාව දියුණු කිරීම සඳහා වැදගත් වන්නේ
1) ආහාර නිෂ්පාදනය වැඩි කිරීම ය.
2) ඒක පුද්ගල ආදායම අඩු කිරීම ය..
3) පිටරටවලින් ආහාර අපනයනය කිරීම ය.
4) ආහාර පරිභෝජනය සීමා කිරීම ය.

05) "මඩ සෝද ගත් කළ ගොවියා රජකමට පවා සුදුසුය." යන ප්‍රකාශය කරන ලද්දේ කවුරුන් විසින් ද?
1) රොබට් නොක්ස්
2) පරාක්‍රමබාහු රජු
3) ධාතුසේන රජු
4) මහසෙන් රජු

06) ශ්‍රී ලංකාවේ ප්‍රධාන දේශගුණික කලාප සංඛ්‍යාව සහ කෘෂි පාරිසරික කලාප සංඛ්‍යාව පිළිවෙලින් වන්නේ
1) 7 සහ 46 ය
2) 3 සහ 46 ය
3) 3 සහ 15 ය
4) 3 සහ 11 ය

07) වායුගෝලයේ සාපේක්ෂ ආර්ද්‍රතාව වැඩි වූ විට
1) ශාකවල උත්ස්වේදනය අඩු වේ
2) ශාක රෝග පැතිරීම අඩු වේ
3) කෘමි පළිබෝධ හානි අඩු වේ
4) ධාන්‍යවල ජීව කාලය වැඩි වේ

08) දෛනික වර්ෂාපතනයේ ප්‍රමාණය සහ තීව්‍රතාව මැනීමට භාවිත කරනුයේ
1) සරල වර්ෂාමානය ය
2) අනිල මානය ය
3) ස්වයංක්‍රීය වර්ෂාමානය ය
4) වාෂ්පීකරණ කැටිය ය

09) නිරිතදිග මෝසම් වැසි ලැබෙන කාලය සහ එම වගා කන්නය ඇතුළත් නිවැරදි පිළිතුර තෝරන්න.
1) මාර්තු සිට අප්‍රේල් - යල කන්නය
2) මැයි සිට සැප්තැම්බර් - - යල කන්නය
3) මැයි සිට සැප්තැම්බර් - මහ කන්නය
4) දෙසැම්බර් සිට පෙබරවාරි - මහ කන්නය

10) බෝග වගාව කෙරෙහි උෂ්ණත්වමානයේ බලපෑම පිළිබඳ වැරදි ප්‍රකාශය තෝරන්න.
   1) බීජ ප්‍රරෝහනය සඳහා පරිසර උෂ්ණත්වයට වඩා වැඩි උෂ්ණත්වයක් හිතකර වේ.
   2) උෂ්ණත්වය වැඩිවන විට, යම් සීමාවන් දක්වා ප්‍රභාසංස්ලේෂණ සීඝ්‍රතාව වැඩි වේ.
   3) කැරට්, බීට් වැනි සෞම්‍ය කලාපීය බෝගවල මල් හට ගැනීම සඳහා අඩු උෂ්ණත්වයක් හිතකර වේ.
   4) දඬු කැබලි මුල් ඇද්දවීම සඳහා පරිසර උෂ්ණත්වයට වඩා අඩු උෂ්ණත්වයක් හිතකර වේ.

11) පහත A, B, C යන රූප සටහන් වලින් දැක්වෙන කාලගුණික දත්ත ලබා ගැනීමේ උපකරණය අනුපිළිවෙළින් ඇති වරණය තෝරන්න.




A



B



C

   1) සූර්ය දීප්තමානය, අනිල මානය, අර්ද්‍රතාවය
   2) සුළං දිශා දර්ශකය, උපරිම අවම උෂ්ණත්වමානය, උෂ්ණත්වමානය
   3) සූර්ය විකිරණමානය, සූර්ය දීප්තමානය, අනිල මානය
   4) තෙත් හා වියළි බල්බ උෂ්ණත්වමානය, සූර්ය දීප්තමානය, වර්ෂාමානය

12) ශ්‍රී ලංකාවේ පහතරට අතරමැදි කලාපයට ලැබෙන වාර්ෂික වර්ෂාපතන ප්‍රමාණය
   1) මි.මී. 2500ට වැඩිය
   2) මි.මී. 1750 - මි.මී. 2500 අතර ය
   3) මි.මී. 900 - මි.මී. 1750 අතර ය
   4) මි.මී. 1750 ට අඩුය

13) වී වගාවේ දී මහ කන්නය සඳහා බිම සැකසීම කළ යුතු වන්නේ කුමන මාසවල දී ද?
   1) දෙසැම්බර් - පෙබරවාරි මාසවලදී ය
   2) මාර්තු - අප්‍රේල් මාසවලදී ය
   3) ඔක්තෝබර් - නොවැම්බර් මාසවලදී ය
   4) ජූලි - අගෝස්තු මාසවලදී ය

14) පාෂාණ ජීර්ණය වීමෙන් ඇතිවන කුඩා ඛනිජ අංශු සුළඟ හෝ ජලය මඟින් ගසාගෙන ගොස් වෙනත් ස්ථානයක තැන්පත් වී, ඒවා විවිධ බන්ධනකාරක මගින් බැඳීමෙන් නිර්මාණය වන පාෂාණ වර්ගය වන්නේ
   1) ආග්නේය පාෂාණ ය
   2) අවසාදිත පාෂාණ ය
   3) විපරීත පාෂාණ ය
   4) යමහල් පාෂාණ ය

15) පහත රූප සටහනේ දැක්වෙන්නේ බෝග වගාවට යෝග්‍ය පසක තිබිය යුතු පාංශු සංඝටකවල ප්‍රතිශත ව්‍යාප්තියයි. මෙහි A, B, C හා D වලින් පිළිවෙළින් දැක්වෙන්නේ
   1) පාංශු වාතය, පාංශු ජලය, පාංශු ඛනිජ සහ කාබනික ද්‍රව්‍ය
   2) පාංශු ජලය, පාංශු ඛනිජ, පාංශු වාතය සහ කාබනික ද්‍රව්‍ය
   3) කාබනික ද්‍රව්‍ය, පාංශු වාතය, පාංශු ජලය සහ පාංශු ඛනිජ
   4) පාංශු ඛනිජ, කාබනික ද්‍රව්‍යය, පාංශු වාතය සහ පාංශු ජලය




16) ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ බහුල ලෙස පැතිරී ඇති පස් කාණ්ඩය වනුයේ
   1) රතු කහ පොඩ්සොලික් පස ය
   2) රතු දුඹුරු ලැටසොලික් පස ය
   3) රතු ලැටසොලික් පස ය
   4) රතු දුඹුරු පස ය

17) යම් ස්ථානයක පස් අංශු දේහයෙන් වෙනස් වීම, ඒවා වෙනත් ස්ථානයකට ප්‍රවාහනය වීම හා තැන්පත් වීම හඳුන්වන්නේ
   1) පාංශු ජනනය වශයෙනි
   2) පාංශු ඛාදනය වශයෙනි
   3) පාංශු ස්ථිරිභවනය වශයෙනි
   4) පාංශු හායනය වශයෙනි

18) මැග්මා ඝනීභවනය වී සෑදෙන්නේ
1) ආග්නේය පාෂාණ ය
2) විපරිත පාෂාණ ය
3) අවසාදිත පාෂාණ ය
4) ආග්නේය හා අවසාදිත පාෂාණ ය

19) පසේ ඇති සියලුම අවකාශ ජලයෙන් පිරී ඇති විට හඳුන්වන්නේ
1) ස්ථිර මැලවීමේ අවස්ථාව ලෙස ය
2) ක්ෂේත්‍ර ධාරිතාව ලෙස ය
3) තාවකාලික මැලවීමේ අවස්ථාව ලෙස ය
4) සංතෘප්ත අවස්ථාව ලෙස ය

20) අධික ලෙස තද පසක පාංශු වහනය දියුණු කිරීමට
1) පසට ජලය යෙදිය යුතුය
2) පසෙන් ජලය ඉවත් කළ යුතුය
3) පස බුරුල් කළ යුතුය
4) පසට මැටි එකතු කළ යුතුය

21) ක්ෂාරීය පසක් උදාසීන කර බෝග වගාවට සුදුසු තත්ත්වයට පත් කිරීමට කළ යුතු වන්නේ
1) පසට හුණු වර්ග එකතු කිරීම ය
2) පසට මැටි එකතු කිරීම ය
3) පසට ජිප්සම් එකතු කිරීම ය
4) පසට භාෂ්මික පොහොර වර්ග එකතු කිරීම ය

22) අන්තර්ජාතික පාංශු විද්‍යා සංගමයේ වර්ගීකරණයට අනුව $0.002mm$ ට වඩා අඩු විෂ්කම්භයක් සහිත පාංශු ඛනිජ වර්ගය වන්නේ
1) රළු වැලි වේ
2) සියුම් වැලි වේ
3) රොන් මඩ වේ
4) මැටි වේ

23) පසක සාරවත් බව පවත්වා ගැනීමේ දී කලිල වැදගත් මෙහෙයක් ඉටු කරයි. පසේ අඩංගු කලිල වර්ග වන්නේ
1) මැටි හා හියුමස් ය
2) මැටි හා රොන් මඩ ය
3) වැලි හා රොන් මඩ ය
4) රොන් මඩ හා හියුමස් ය

24) රෝල් ක්‍රමයට පාංශු වයනය නිර්ණය කිරීමේ දී පහත ආකාරයට නිරීක්ෂණය වන්නේ කුමන වයනයක් සහිත පසක් ද?



1) වැලි පස
2) වැලි ලෝම පස
3) මැටි පස
4) මැටි ලෝම පස

25) පහත වගුවෙහි කුල අනුව නිවැරදි බෝග දක්වා ඇත්තේ කුමන අක්ෂරය යටතේ ද?

| අක්ෂර | පොඒසියේ | ෆැබේසියේ | කුකඩ්ටේසියේ |
|---|---|---|---|
| A | වී | කරවිල | වට්ටක්කා |
| B | බෝංචි | මිරිස් | කරවිල |
| C | කුරක්කන් | කඩල | පතෝල |
| D | දිවුල් | මුං | මෙනේරි |

1) A
2) B
3) C
4) D

26) කොළ පොහොර ලෙස ප්‍රයෝජනයට ගන්නා ශාක දෙකකි.
1) වල් සූරියකාන්ත හා අඩනහිරියා
2) හාතවාරිය හා මොනරකුඩුම්බිය
3) වල් අල සහ මහෝගනී
4) උඳුපියලිය හා ජූට්

27) රනිල කුලයේ ශාකවල මූල ගැටිතිවල ජීවත් වන බැක්ටීරියා වර්ගයේ නම්
1) පැරමීසියම් ය
2) රෛයිසෝබියම් ය
3) සියුඩොමනාස් ය
4) නයිට්‍රොසොමොනාස් ය

28) වැටි හා කාණු සහිත පාත්තිවල සිටුවිය හැකි බෝග දෙකක් වන්නේ
1) බතල හා රටකජු ය
2) මිරිස් හා අන්නාසි ය
3) තක්කාලි හා මිරිස් ය
4) බණ්ඩක්කා හා රාබු ය

29) F M R C ගොඩ බීජ වපකරය යොදා ගෙන සිටුවිය හැකි බෝග කිහිපයක් වන්නේ
1) බඩඉරිගු, සෝයා බෝංචි හා කව්පි
2) මුං ඇට, තල හා වී ය
3) කුරක්කන්, මෙනේරි හා මිරිස් ය
4) කැරට්, බීට් හා ලීක්ස් ය

30) බහු වාර්ෂික බෝගයක් වන පොල් වගා කිරීමේ දී යොදා ගන්නා තනි වගා වලක ප්‍රමාණය වන්නේ

1) මීටර $50 \times 50 \times 50$
2) සෙන්ටි මීටර $90 \times 90 \times 90$
3) සෙන්ටි මීටර $65 \times 65 \times 65$
4) මීටර $2 \times 2 \times 2$

31) තවානක් ජීවානුහරණය කිරීමේ අරමුණ වන්නේ

1) තවානේ ස්ථාන ව්‍යාධිජනිකයින් හා වෙනත් පළිබෝධ ආකාර විනාශ කිරීම ය.
2) බීජ ප්‍රරෝහණය සඳහා අවශ්‍ය උෂ්ණත්වය ලබා දීම ය.
3) බීජ ප්‍රරෝහණයට අවශ්‍ය තෙතමනය ලබා දීම ය.
4) පැළවලට අවශ්‍ය පෝෂක ලබා දීම ය.

32) ඉහත රූපයෙන් දක්වෙන්නේ තවාන් පාත්තියක් ජීවානුහරබය කරනු ලබන ක්‍රමයකි. මෙම ජීවානුහරණ ක්‍රමය වන්නේ



1) සූර්ය තාපය මගින් ජීවාණුහරණය
2) පිළිස්සීම මගින් ජීවාණුහරණය
3) උණු ජලය මගින් ජීවාණුහරණය
4) රසායන ද්‍රව්‍ය මගින් ජීවාණුහරණය

33) තවාන් මිශ්‍රණයක් සඳහා භාවිතා කරන මාධ්‍ය මිශ්‍රණය හා එහි අනුපාතය පිළිවෙළින් දක්වා ඇති පිළිතුර දක්වන්න.

1) මතුපිට පස් 1 : වැලි 1
2) මතුපිට පස් 1 : කාබනික පොහොර 1
3) වැලි : කාබනික පොහොර 2
4) මතුපිට පස් 1 : වැලි 2

34) උදුරා සිටුවීමට ඔරොත්තු නොදෙන බීජ තවාන් කිරීමට යෝග්‍ය තවාන් වර්ගය වන්නේ

1) උස් තවාන් ය
2) ගිල්වූ තවාන් ය
3) සමූහ බඳුන් තවාන් ය
4) නොරිදෝකෝ තවාන් ය

35) තවානක සිටුවා ඇති පැළ, ක්ෂේත්‍රයේ සිටුවීමට සුදුසු තත්ත්වයට ක්‍රමයෙන් හුරු කිරීම හඳුන්වනුයේ

1) ජීවාණුහරණය ලෙස ය
2) වසුන් යෙදීම ලෙස ය
3) දෘඩි කිරීම ලෙස ය
4) සෙවණ සැපයීම ලෙස ය

36) පහත දක්වා ඇත්තේ ජලවහන පද්ධතියක රූප සටහනකි.
එම ජල වහන ක්‍රමය වන්නේ



1) හෙරින්බෝන් ක්‍රමය
2) සමාන්තර ක්‍රමය
3) ගල් කාණු ක්‍රමය
4) කඩොල් කාණු යෙදීම ය

37) පහත දක්වා ඇති ක්‍රියාමාර්ග අතරින් පසට යොදන ජලය හානි වීම අවම කිරීමට සුදුසු ක්‍රියාමාර්ග කවරේද?

A- ආවරණ බෝග වගා කිරීම
B- රසායනික පොහොර භාවිතය
C- කාබනික පොහොර භාවිතය
D- පස මතුපිටට වසුන් යෙදීම

1) A, B හා D ය
2) A, C හා D ය
3) A හා D ය
4) B, C හා D ය

38) පිටාර ජල සම්පාදනයේ වාසියක් වන්නේ

1) වැඩි ජල ප්‍රමාණයක් අවශ්‍ය වීම ය
2) මූලික වියදම අඩු වීම ය
3) පස මඩ වීමෙන් උපකරණ භාවිතය අපහසු වීම ය
4) වාෂ්පීකරණයෙන් ජලය අපතේ යාම ය

39) ඉතා කාර්යක්ෂම ජල සම්පාදන ක්‍රමයකි.

1) ඉසින ජල සම්පාදනය
2) පිටාර ජල සම්පාදනය
3) බිංදු ජල සම්පාදනය
4) බේසම් ජල සම්පාදනය

40) දුර්වල ජලවහනය නිසා

1) පසේ වාතනය යහපත් වේ
2) මූල පද්ධතිය ගැඹුරට වර්ධනය වේ
3) බීජ ප්‍රරෝහණය හොඳින් සිදුවේ
4) ශාක මුල් ආශ්‍රිතව දිලීර රෝග ඇති වේ